# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2458/02 - 2025 ඔක්තෝබර් මස 13 වැනි සඳුදා - 2025.10.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: කඩු/ඉඩම්/01/144/WS.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව රජය වෙත පැවරී ඇති බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*රජයට පැවරී ඇති ඉඩමේ/ පරවශතාවේ විස්තර*:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 474/ඒ රග්ගහවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රග්ගහවත්ත ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කර ඇති ක.සි. 522011 හා 2025.06.18 දින දරන කඩඉම් සිතියමේ කලාප 01, පත්‍ර අංක 01හි කැබලි අංක 01 ලෙස පෙන්නුම් කරන පහත විස්තර කෙරෙන ඉඩම් කැබල්ල.

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: දිසාවත්ත නොහොත් කටුගම්පලයාඹිටිය, ගොඩැල්ලවත්ත, රග්ගහවත්ත නොහොත් තිඹිරිගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් හා තාවකාලික ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: රජය, මුල් හිමිකම් කියන්නා: මංජුල පලිහේන මයා, පී. ඩී. නාලක පලිහේන මයා, ශ්‍යාමලී පලිහේන මිය; ඉඩම් ප්‍රමාණය: හෙක්. 0.5514.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025.10.16 වැනි දින පෙ.ව. 9.30 ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2025.10.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/ පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් පෑමට සහාය වන සියලුම ඔප්පු හා ලියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**එච්. එස්. සම්පත් ඉඩම්ගොඩගේ,**
ප්‍රාදේශීය ලේකම්
කඩුවෙල

2025 ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10-0126